| | | |
|---|---|---|
| පැවරුම | :- | සතිය - 12 (2021- 03 - 22 සිට 2021- 03 - 28 දක්වා) |
| ඒකකය 02 | :- | ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය |
| ක්‍රියාකාරකම අංක 05 | :- | ඉංග්‍රීසීන් යටතේ මෙරට ඇති වූ සමාජ හා ආර්ථික වෙනස්වීම් |
| පැවරුම් අංක 05 | :- | වතු වගාවේ ව්‍යාප්තිය පිළිබඳ සොයා බලමු. |
| හැඳින්වීම | :- | බ්‍රිතාන්‍යයන් මෙරට තම බලය වර්ධනය කරගත් පසු එතෙක් පැවති ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය වාණිජ ආර්ථිකයක් බවට පරිවර්තනය කළහ. 1833 ක්‍රියාත්මක කළ කෝල්බෘක් ප්‍රතිසංස්කරණ මගින් මෙරට තුළ වාණිජ ආර්ථිකයක් ගොඩ නැගීමට කටයුතු කෙරිණි. එසේ බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිසංස්කරණ මෙරට ආර්ථික ක්ෂේත්‍රය පමණක් නොව සමාජ රටාවෙහිද වෙනස්කම් රැසක් ඇති කර තිබේ. වර්තමානයේ මෙරට ක්‍රියාත්මක වන ආර්ථිකයේ හැඩය එහිදී ඇති කළ ආර්ථිකයේ හැඩගැස්මකි. |
| සිසු උපදෙස් | :- | *පියවර 01* පෙළ පොතෙහි පිටු අංක 41 - 48 දක්වා හොඳින් කියවා ගන්න.<br>*පියවර 02* ඉහතින් දී ඇති හැඳින්වීම සටහන් කරගන්න.<br>*පියවර 03* පෙළ පොත උපයෝගී කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. |

## ප්‍රශ්නාවලිය

1) 1833 කෝල්බෲක් යෝජනා තුළ පැවති පෞද්ගලික අංශය දිරිමත් කොට ආර්ථිකය දියුණු කිරීම මගින් දිගු කාලීන ආදායම වැඩි කර ගැනීමට ඉදිරිපත් කළ යෝජනා තුනක් දක්වන්න.

2) රජයේ වියදම අඩු කිරීමට කෝල්බෲක් කොමිසම ඉදිරිපත් කළ යෝජනා මොනවාද?

3) කෝල්බෲක් කොමිසමේ යෝජනා තුළ පෞද්ගලික ව්‍යාපාරික අරමුණු වලට ගැලපෙන ලෙස සකස් වූ යෝජනා දක්වන්න.

4) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරටට හඳුන්වා දුන් වාණිජ බෝග නම් කරන්න.

5) කෝපි වගාව දියුණු වීමට බලපෑ සාධක තුනක් හා පරිහානියට බලපෑ සාධක දෙකක් දක්වන්න.

6) කෝපි වගාවට වැළඳුන දිලීර රෝගය කුමක්ද?

7) කොකෝවා හා සිංකෝනා වල ඇති ප්‍රයෝජන ලියා දක්වන්න.

8) මෙරටට මුලින්ම තේ වගාව හඳුන්වා දුන්නේ කා විසින්ද, එසේ මුල්ම තේ වගාව ආරම්භ කළ ස්ථානය කුමක්ද?

9) පහතින් දක්වා ඇති බෝග වල පර්යේෂණායතන පිහිටා ඇති ස්ථාන නම් කරන්න.
   - තේ
   - රබර්
   - පොල්

සැකසුම :- උදාර අරවින්ද
ර/ කලවාන ජාතික පාසල
නිවිතිගල අධ්‍යාපන කලාපය